34 වන පිටෙන්

කටයුතු කළ බවයි පෙනුනේ. මේ තරම්ම උනන්දුවක් ඇතිවෙන්න හේතු වුණේ මොනවද?

නෑ මම එහෙම විශේෂ උනන්දුවක් දැක්වුවේ නෑ. කමිටුවට විරුද්ධව අභූත චෝදනා කරන කොට කමිටු සාමාජිකයෙක් විදිහට ඒවාට උත්තර දුන්න එකයි මම කළේ. මොකද ඒ වෙනකොට මම චෝදනා ගැන හොඳට අධ්‍යනය කරලයි තිබුණේ.

ඔබගේ බිරිඳ ජාතික රෝහලේ අධ්‍යක්ෂ ධුරය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ පෙත්සමේදි ඇයට අවාසි සහගත තීන්දුවක් ලැබී තිබුණා. ඊට පෙර එක් අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවකින් ඔබගේ මන්ත්‍රී ධුරය අහිමිවෙලා තිබුණා. මේ කාරණා නිසා ඔබ කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කිරීමට විරෝධතාවක් එල්ල වුණා නේද?

මගේ වෛද්‍ය වෘත්තියේ විෂය පථයට අයත් කාරණයක් සම්බන්ධයෙන් ඇතිකරගත්ත ගිවිසුමකට අදාළව පවරපු නඩුවකදි තමයි මගේ මන්ත්‍රී ධුරය අහිමි කළේ. ආණ්ඩුවේ ඉදගෙන කරපු කොන්ත්‍රාත් එකක් නිසා නෙවෙයි. ආණ්ඩුවට පහර පිට පහර ගහමින් ඉන්න කාලේ වෘත්තීය අවශ්‍යතා වෙනුවෙන් කළ ගනුදෙනුවක් නිසා. එදා අධිකරණය නඩුව අහලා මාස තුනක් යනකම් තීන්දුව දුන්නේ නෑ. අධිකරණයේ විවාදය ආරම්භ වෙන දිනයට කලින් දවසේ හවස තුනට මාව කැඳවලා තීන්දුව දුන්නා. මොකද මට අභියාචනාධිකරණයට යන්න බැරිවෙන විදිහට. අනික මගේ භාර්යාවගේ එක. රනිල් වික්‍රමසිංහ මහත්තයාත් මට කිව්වා එයා නීතිඥවරුන්ට කිව්වා කියලා ඒක මතුකරන්න එපා. මොකද ඒකෙට කිසිම සම්බන්ධයක් නැති දෙයක් කියලා. මගේ නෝනා නඩු කිව්වේ ආණ්ඩුවට විරුද්ධව. එතුමිය නඩු තීන්දුව දුන්නේ ආණ්ඩුව වෙනුවෙන්. මම කැබිනට් ඇමැතිවරයෙක් වෙලා මමවත්, මගේ නෝනාවත් කාගෙවත් පස්සේ ගියේ නෑ තනතුරු ඉල්ලලා. හරි කමක් නෑ. ඒක වැරදියි කියලා කියමුකෝ. එහෙනම් අගවිනිසුරුවරිය කොහොමද මට විරුද්ධව නඩු දෙකක් ඇහුවේ. 1996 එතුමිය ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු ධුරයකට පත්කරපු වෙලාවේ ඒ පත්වීමට විරුද්ධව මම පාර්ලිමේන්තුවේදි විනාඩි 45ක් කතා කළා. මේ විදිහට පිටින් කෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට පත්කරන එක වැරදියි කියලා. කමිටුවේදි එතුමියගේ නීතිඥවරයා ඕක මතුකළ වෙලාවේ එතනදිත් මම කිව්වා මෙතුමියත් එක්ක මට කිසිම පෞද්ගලික ප්‍රශ්නයක් නෑ. මම කැමතියි ගමෙන් ආව කෙනෙක් ඒ වගේ තැනකට එනවාට. නමුත් වැරැද්ද අධිකරණයේ කිසිම සර්විස් එකක් නැති කෙනෙක් එතනට ගෙනඒමයි කියලා මම කිව්වා. මම ඇහුවා එහෙනම් ඔබේ පත්වීමට විරුද්ධව ඉදිරිපත්වුණ මගේ නඩුවකට 2002 වසරේදි ඔබතුමිය කොහොමද වාඩිවුණේ කියලා. ඒතන තියන සදාචාරය මොකක්ද කියලා. අගවිනිසුරුවරිය හැටියට ඔබතුමියට නැති සදාචාරයක් මට තියෙන්න පුළුවන්නේ කොහොමද කියලා මම ඇහුවා. ඔබතුමිය එදා ඒක ප්‍රතික්ශේප කරලා තිබුණා නම් මමත් මේක ප්‍රතික්ශේප කරනවා කියලා. එතකොට මේ අය නිශ්ශබ්ද වුණා.

ඔය කාරණය නව අගවිනිසුරුවරයාගේ පත්වීම සම්බන්ධයෙනුත් ඔය විදිහටම අදාළ කරගන්න පුළුවන් නේද? ඔහුත් අධිකරණ සේවයට බාහිරින් ගේන කෙනෙක්?

එතුමා හිටපු නීතිපතිවරයෙක්. දීර්ඝ කාලයක් අධිකරණයේ පෙනී ඉදලා නඩු කතා කරලා පළපුරුදු කෙනෙක්. එහෙම කෙනෙකුට නඩු අහන්න පුළුවන්. ඇකඩමික් කෙනෙකුට වගේ නෙවෙයි. කැබිනට් මණ්ඩලයේ නීති උපදේශකයා, රටේ අගවිනිසුරු ධුරයට පත්කිරීම ගැන ගැටළුවක් නැත්ද? නීතිපති කියන්නේ මොකක්ද? රජයට නීති උපදෙස් දෙන කෙනා. කැබිනට් මණ්ඩලයේ උපදේශක කියන්නේ කැබිනට් මණ්ඩලයට උපදෙස් දෙනවා. කැබිනට් එකට උපදෙස් දෙනවා කියනනේ කැබිනට් එක ආශා කරන දේවල් දෙනවා කියන එක නෙවෙයිනේ. එහෙම නම් කැබිනට් මණ්ඩලයට උපදේශකයෙක් උවමනා නෑනේ.

ඔහුගේ විශ්වසනීයත්වය ගැන ප්‍රශ්න තිබෙනවා නේද? ජාත්‍යන්තර සමුළුවලට ගිහින් බොරු කියපු කෙනෙක් විදිහට?

එක්සත් ජාතීන්ගේ සමුළුවේදී එයා නියෝජනය කළේ ශ්‍රී ලංකාව. එයා ජාත්‍යන්තරයට ගිහිල්ලා කතා කළේ ශ්‍රී ලංකාව වෙනුවෙන්. නැතුව ආණ්ඩුව වෙනුවෙන් නෙවෙයි. එයා එතැනදි කතා කරන්නේ එයාට දීලා තියන වාර්තා අනුව. නීතිපතිවරයෙක් විදිහට උසාවියේ කතාකරන එකයි. ජාත්‍යන්තරයට ගිහිල්ලා රටවෙනුවෙන් කතා කරන එකයි එකිනෙකට වෙනස්නේ. එයා කිව්වේ සීඅයිඩී එකෙන් මට දීලා තියන වාර්තාවලින් කියවෙන්නේ එක්නැලිගොඩ පිටරට ඉන්නවා කියලයි. තමන්ගේ රජය ලබාදෙන වාර්තාවල තියන කාරණානේ ජාත්‍යන්තර සමුළුවලදී නීතිපති ඉදිරිපත් කරන්නේ. නැතුව ඒ මනුස්සයා එක්නැලිගොඩ ගැන පරීක්ෂණ කරන්නේ නෑනේ. ඒකේ වරදක් තියනවා නම් පරීක්ෂණ කරපු කණ්ඩායම්වල වරදක් මිස එතුමාගේ වරදක් නෙවෙයි.

නව අගවිනිසුරුවරයා රජයේ මුදල් කෝටි ගණනක් වංචා කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබා සිටින, ඒ සම්බන්ධයෙන් විභාග වෙමින් පවතින නඩුවක චූදිතයෙක් කියන කාරණය රාවය පුවත්පත සවිස්තර වාර්තාවකින් හෙළිදරව් කරලා තිබුණා? එවැනි අයෙක් අගවිනිසුරු ධුරයට සුදුසුද?

රාවය පත්තරේ ශිරාණි බණ්ඩාරනායකටත් ඕකමනේ කිව්වේ. එදා ආණ්ඩුවත් එක්ක ඉන්නවා කියලා ශිරාණි බණ්ඩාරනායකව පතුරු ගහපු රාවයේ ජනරාජනමනේ ශිරාණිට ආණ්ඩුවෙන් දෝෂාභියෝගය ගෙනාවම අනෙක් පැත්තට 'නීතිය අවහිතිය' කියලා ලිපියක් ලිව්වේ. ජේවීපී එක කළෙත් ඔය දේමනේ. දැන් මොහාන් පීරිස්ට විරුද්ධව ඔය ලියන අයම තව අවුරුද්දකින් මොහාන් පීරිස් ආණ්ඩුවට විරුද්ධව තීන්දුවක් දුන්නම මොහාන් පීරිස්ව කරේ තියාගන්නවා. ඔය තුට්ටු දෙකේ දේශපාලනය.

මොහාන් පීරිස් අගවිනිසුරු ධුරයට පත්කිරීමේ කිසිම වරදක් ඔබ දකින්නේ නැත්ද?

කමිටුවේ කටයුතු ඉවර වුණාට පස්සේ, නව අගවිනිසුරුවරයෙක් පත්වීමට මගේ ඇති කිසිම සම්බන්ධයෙක් නෑ. මම මොහාන් පීරිස් වෙනුවෙන් කතා කරනවා නෙවෙයි. නමුත් මොහාන් පීරිස් කියන්නේ රටේ ඉන්න ඉහළම නීතිවේදියෙක්. මම හිතන්නේ හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ සුදුසුකම් ලබපු වෙන කිසිම කෙනෙක් නෑනේ. ඔබාමල, මිවෙල් ඔබාමල වගේ එක්කෙනෙකුට තමයි හාවර්ඩ් එකට ගිහිල්ලා ඩිග්රියක් ගහන්න පුළුවන්. මොහාන් පීරිස් ඒ වගේ එක්කෙනෙක්. එයාගේ හැසිරීම ගැන මම කතාකරන්න යන්නේ නෑ.

දෝෂාභියෝගයේ කටයුතු සිද්ධ වෙච්ච ආකාරය ගැනත් ඔබට කිසිම ගැටළුවක් නෑ?

මම කමිටුවට පත් කළ වෙලාවේ මම අනුර යාපාට කිව්වා හැබැයි අනුර මේ චෝදනා හරියටම ඔප්පුවෙන්නේ නැත්නම් මම බොරුවට කමිටු වාර්තාවට අස්සන් කරන්නේ නෑ කියලා. මොකද හිතට එකඟ නැති දෙයක් කරලා මැරෙනකම් විඳව විඳව ඉන්න බැහැනේ. විමල් වීරවංශත් ඒක කිව්වා. මොකද අපි කමිටුවට පත්වෙනකොට මේ චෝදනා මොනවද කියලා දැනගෙන හිටියේ නෑ. පත්වුණාට පස්සේ තමයි අපිට චෝදනා විස්තර ලැබුණේ. මම දෝෂාභියෝගයට අස්සන් කළේ නැත්තෙත් ඒකේ තියන චෝදනා මොනවද කියලා දන්නෙ නැති නිසා. තියෙන්නේ මොනවද කියලා නොදැන අස්සන් කරන්න බෑනේ. කමිටුවට පත් කළාට පස්සේ මේ චෝදනා විස්තර අපිට ලැබුණා. ඊට පස්සේ මම ඉතා හොඳින් ඒවා එකින් එක අධ්‍යනය කළා. මේවා බැලුවම සරත් සිල්වට තිබුණ චෝදනා මොනවද කියලා මට හිතුණා. පවතින ක්‍රමය තුළ අපි කටයුතු සිදුකළා.

දැන් කමිටුව කියන විදිහට අගවිනිසුරුවරියට විරුද්ධව බරපතල දූෂණ චෝදනා ඔප්පු වෙලා තියනවා නම් රටේ තියන සාමාන්‍ය නීතිය අනුව ඒවා අල්ලස් කොමිසමට පැමිණිලි කරලා ඇයට එරෙහිව නඩු පවරලා අධිකරණය ඉදිරියෙත් චෝදනා ඔප්පු කරලා ඇයට දඩුවම් පමුණුවන්න පුළුවන්නේ. ඇයි ආණ්ඩුව ඒක නොකරන්නේ?

අපි දෝෂාභියෝගය එක්කම අල්ලස් කොමිසමටත් මේ තොරතුරු දීලා පැමිනිලි කරලා තියෙන්නේ. කොමිසම ඉදිරියේදී එතුමියට විරුද්ධවත් නඩු පවරාවි.

35 වන පිටෙන්

ඉඩදීලා බලාගෙන ඉන්නවද, එහෙම නැතිනම් විකල්ප පියවර වෙත යොමුවෙනවද කියන ප්‍රශ්නය නීතිඥ සංගමයේ අවධානයට ලක්වෙන්නේ නැත්ද?

නීතිඥ සංගමය කියන්නේ රටේ විපක්ෂයවත්, ආණ්ඩුවත් එක්ක සටන් කරන ආයතනයක් වත් නෙවෙයි. ඒ වෙනුවෙන් සටන් කරන්න රටේ වෙනම කණ්ඩායම් ඉන්නවා. විපක්ෂය තියනවා. වෘත්තීය සමිති තියනවා. සිවිල් සංවිධාන තියනවා. ඒ හරහා තමයි ඉදිරියට යම් දෙයක් සිදුවෙනවා නම් සිදුවිය යුත්තේ. ඒවා නීතිඥ සංගමයට කරන්න පුළුවන් දේවල් නෙවෙයි.

දෝෂාභියෝගයදි මතුවුණ විවාදාත්මක කාරණා ගණනාවක් තියනවා. ආරම්භයේදී කියැවුණේ දෝෂාභියෝගයේදි පාර්ලිමේන්තුව අධිකරණයක් ලෙස ක්‍රියාකරනවා කියලා. නමුත් පසුව අහන්න ලැබුණේ සිදුවෙන්නේ අධිකරණ කටයුත්තක් නෙවෙයි විනය පරීක්ෂණයක් වැනි දෙයක් කියලා?

පාර්ලිමේන්තුවේ බොහෝ දෙනෙකුටත් මේක ගැන අවබෝධයක් නෑ. කමිටුවේ හිටපු සමහර සාමාජිකයෝ කතා කරනකොටත් තේරෙනවා ඒගොල්ල කරපු දේ මොකක්ද කියලාවත් ඒ අයට අවබෝධයක් නෑ. ඒක තමයි අත්තත කතාව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම තියෙන්නේ ඔප්පු කළ 'විෂම පැවැත්ම' සම්බන්ධයෙන් කියලයි. ඔය කියන කාරණය තුළම තියෙන්නේ විනිශ්චය කාර්යයක්. ඉතිං ඒක අනුව තමයි ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය නඩු තීන්දු දෙකක් දුන්නේ. 2003 පොදු රාජ්‍ය මණ්ඩලයේදී, ඒක අධිකරණ කාර්යයක් විදිහට අපි පිළිඅරන් තියනවා. පිළිඅරගෙන එකඟවෙලා තියනවා. ඒ අනුව තමයි මේකට පොදු රාජ්‍ය මණ්ඩලයේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු තුන්දෙනෙක්ගෙන් සමන්විත මණ්ඩලයක් දාන්න කියලා එකඟවෙලා තියෙන්නේ. ඒක 2000 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙත් තියන කාරණයක්. 2003 රනිල් වික්‍රසිංහ අගමැතිතුමා සරත් සිල්වාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනාපු වෙලාවේ පොදු රාජ්‍ය මණ්ඩලයට ලියලා තියනවා, නම් යෝජනා කරලා. පොදු රාජ්‍ය මණ්ඩලයේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ නම් ඇතුව. එංගලන්තයේ ප්‍රිවි කවුන්සිල් එකේ ලෝඩ් පිළිජ්ගේ නම ඒකේ තියනවා. ඉන්දියාවේ හිටපු අගවිනිසුරු වර්මාගේ නම ඒකේ තියනවා. ඕස්ට්‍රේලියාවේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකුගේ නමක් තියනවා. ඒ ක්‍රමවේදය පාර්ලිමේන්තුව දැනගෙන හිටියා. පාර්ලිමේන්තුව එය පිළිඅරගෙන තිබුණා. එසේ තිබියදී තමන් රවටා ගැනීම සඳහා තර්ක ඉදිරිපත් කිරීමේ ක්‍රියා පිළිවෙතක් තමයි ආණ්ඩු පක්ෂය ගෙනිච්චේ.

දෝෂාභියෝග ක්‍රියාදාමයේ යම් වරදක් තියනවා වෙන්න පුළුවන් වුණත්, පවතින ක්‍රමය තුළ ඉදිරිපත් කෙරෙන දෝෂාභියෝගයක් විමර්ශණය සිදුවිය යුත්තේත් ඒ ක්‍රමය අනුවමයි කියන තර්කයක් ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත්වුණා?

ඒක හරි බොළඳ තර්කයක් නේ. දැන් නෙවිල් සමරකෝන්ට දෝෂාභියෝගය ගේන කොට ඒ පිළිබඳ තීරණ ගන්න ස්ථාවර නියෝග තිබුණොත් නෑනේ. ඒ දෝෂාභියෝගය ගෙනාවට පස්සේ තමයි ස්ථාවර නියෝගය සම්මත කරගත්තේ. ඒක නිසා තමයි මේ අවස්ථාවේ දෝෂාභියෝගය ගේනකොටම අපි පාර්ලිමේන්තුවට පණතක් ගෙනාවේ. අවශ්‍යතාවක් තිබුණානම් ඒක හදිසි පනතක් විදිහට දවස් දෙකෙන් සම්මත කරගන්න තිබුණා. ඒක මගහරින්න කියන බොළඳ කතා තමයි ඔය.

ඔබ ඉදිරිපත් කළ ඒ පනත් කෙටුම්පතට මොකක්ද වුණේ?

ඒක ගැසට් කරලා තියනවා. තවමත් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා නෑ.

දෝෂාභියෝගයට එරෙහිව කතාකරන අය හැම වෙලාවෙම කතාකරන්නේ දෝෂාභියෝග ක්‍රියා පටිපාටියේ අඩුපාඩුකම් ගැන විතරයි, අගවිනිසුරුවරියට එරෙහිව ඉදිරිපත්ව ඇති චෝදනා ගැන වචනයක්වත් කතා කරන්නේ නෑ, කියන චෝදනාවත් ආණ්ඩුව දිගින් දිගටම එල්ල කළා.

ඉතිං ඒක සාධාරණයිනේ. මොළේ තියන අයට තේරෙනවානේ. ක්‍රමවේදයක් නැතුව චෝදනා හරිද වැරදිද කියලා කවුද, කොහොමද තීරණය කරන්නේ කියලා. මේ රටේ පොල් ගෙඩියක් හොරකම් කරපු මිනිහෙක්ගේ නඩුවක්වත් අහන්න පුළුවන්ද මහේස්ත්‍රාත් කෙනෙකුගේ මේරිටමට අඩු සුදුසුකම් තියන කෙනෙකුට. මේ රටේ සාමදාන විනිශ්චයකාරකම දෙන්න තහනම්, උසස් පෙළ විභාගය සමත් නැති අයට. නමුත් අගවිනිසුරුතුමියගේ නඩු අහන්න පුළුවන් අට පාස් නැති අයට. ඒක නිසා තමයි අපි කියන්නේ ක්‍රමවේදයක් හදන්න. ගමේ ඉන්න අප්පුහාමිටයි, බෙම්පිටයි කියන්න බෑ අගවිනිසුරුවරිය වැරැද්දක් කළාද, නැත්ද කියලා. එතුමිය වැරැද්දක් කළාද නැත්ද කියලා අපිත් දන්නේ නෑ. අගවිනිසුරුතුමිය වෙනුවෙන් නීතිඥ සංගමය පෙනී හිටියෙත් නෑ. අපි පෙනී හිටියේ අගවිනිසුරු තනතුර වෙනුවෙන්. අපි කිව්වේ වැරදි කරලා නම් එතුමිය යවන්න. හැබැයි වැරදිද්දක් කළාද, නැත්ද, කියන එක තීරණය කරන්න දේශපාලන හෙංචයියලට බෑ කියන එකයි. ඒක තීරණය කරන්න විනිශ්චයකාරවරුන්ට දෙන්න කියලයි අපි කිව්වේ. අපේ ඉල්ලීම බොහොම සාදාරණ එකක්.

දෝෂාභියෝගය අතරේ ඔබේ නිවෙසට වෙඩි ප්‍රහාරයක් එල්ල වුණා. රටේ ප්‍රධාන පුරවැසියෝත්, දෙවැනි පුරවැසියාත් ඒ අවස්ථාවේ ඔබේ නිවෙසට පැමිණ මේ ගැන කරුණු විමසුවා. කඩිනමින් පරීක්ෂණ පවත්වන්න කියලා පොලිසියට උපදෙස් දුන්නව වාර්තා වුණා. අන්තිමට මොකක්ද වුණේ?

ලංකවේ හැම දේකටම වෙන දේ ඒ සිද්ධියටත් වුණා. තවම පොලිසිය කිසිම දෙයක් හොයාගෙන නෑ.

ඉදිරියේදී පැවැත්වෙන නීතිඥ සංගමයේ නිල වරණයේදී, ඔබ සභාපති ධුරයට තරඟ කරන්න තීරණය කිරීමට බලපෑ විශේෂ හේතු තියනවාද?

මම ගිය අවුරුද්දේ සභාපති ධුරයට තරඟ කරන කොටම කිව්වා එක අවුරුද්දකට විතරයි මම එන්නේ කියලා. මොකද මගේ වැඩ රාජකාරි එක්ක අවුරුදු දෙකක් මේකට යොදවන්න මට බෑ. අනික ඔය අවුරුදු දෙකක් දෙන්න තීරණය වෙලා තියෙන්නේ නීතිඥ සංගමයේ දාහක්, දෙදාහක් වගේ සාමාජිකයෝ ඉන්න කාලේ. දැන් සාමාජිකයෝ දහතුන් දහක් ඉන්නවා. ඒ නිසා අවුරුදු දෙකක්ම ධුරයේ සිටීම අත්‍යවශ්‍යයයි කියලා මම හිතන්නේ නෑ.